# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## එකතු කළ අගය මත බදු (සංශෝධන)

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය විසින් 2026 මැයි මස 19 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2026 අප්‍රේල් මස 29 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[65 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 129.60** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් ඉලෙක්ට්‍රොනික වේදිකාවක් හරහා සපයනු ලබන සේවා සඳහා (මෙහි මින් මතු "වැට් බදු" යනුවෙන් සඳහන් කරනු ලබන) එකතු කළ අගය මත බදු අය කිරීමේ දිනය 2026 ජූලි මස 1 වන දිනය දක්වා දීර්ඝ කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ වැට් බදු කාර්යය සඳහා චිත්‍රපට ප්‍රදර්ශන සේවාවක් සැපයීමේ වටිනාකම නිශ්චය කිරීමේ දී (267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනත යටතේ අය කරන ලද විනෝද බද්ද අඩු කිරීමට හැකියාව ලබාදීම වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනය, සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමය ඉවත් කිරීමට ආනුෂංගික වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ වැට් බදු සඳහා තැනැත්තන් ලියාපදිංචි කිරීම සඳහා වන සීමාව අඩු කිරීම සහ එය 2026 ජූලි මස 1 වන දින සිට බලාත්මක කිරීම වේ.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ අදාළ උපලේඛන බදු කාලසීමාව ආරම්භ වන දිනයේ සිට සැපයීම සඳහා පහසුකම් සැලැස්වීම වේ.

***7 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) නැවත අපනයනය කිරීමේ පදනම මත ආනයනය කර ඇති මුත් නැවත අපනයනය කර නොමැති පිරියත, යන්ත්‍රසූත්‍ර, උපකරණ හෝ වාහන මත ඇති යෙදවුම් බදු බැරවලට ඉඩ හරිනු නොලැබීම; සහ

(ආ) තොග හෝ සිල්ලර වෙළඳාමේ නිරත තැනැත්තකුගේ ලියාපදිංචි වීමේ දිනය වන විට, නොවිකුණා ඇති භාණ්ඩ තොග මත සලකනු ලබන යෙදවුම් බදු බැරවලට හිමිකම් කියා පෑම සඳහා වන පූර්වාවශ්‍යතාවයක් ලෙස එම භාණ්ඩ තොගවලට අදාළව වාර්තා පවත්වාගෙන යාම,

සඳහා විධිවිධාන ඇතුළත් කිරීම වේ.

***8 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ අදාළ විධිවිධාන යටතේ සේවානියුක්තයන්ට ගෙවනු ලබන පඩිනඩි පිළිබඳ විධිවිධානවලට අදාළ අවශ්‍ය ආනුෂංගික සංශෝධන සිදු කිරීම; සහ

(ආ) මූල්‍ය සේවා මත වන වැට් බදු සියයට දහඅටේ (18) සිට සියයට විස්සයි දශම පහ (20.5) දක්වා වැඩි කිරීම වේ.

***9 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට IIIඇ වන අලුත් පරිච්ඡේදය ඇතුළත් කරනු ලබන අතර අලුත් පරිච්ඡේදය මගින් ඩිජිටල් සේවා මත බදු ලියාපදිංචි කිරීම සහ ගෙවීම සඳහා විධිවිධාන සලස්වනු ලැබේ.

***10 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 48ඇ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර අලුත් වගන්තිය මඟින් සුනාමි ව්‍යාපෘතිවලට අදාළව ගෙවීම පැහැර හැර ඇති බදු කපා හැරීම සඳහා විධිවිධාන සලස්වනු ලැබේ.

***11 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමය ඉවත් කිරීමට වන ආනුෂංගික සංශෝධන සිදු කිරීම වේ.

***12 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 64ආ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, අලුත් වගන්තිය මඟින් පිරිවැටුම සහ වැට් බදු එකතු කිරීමට අදාළව නිසි ගිණුම්කරණය තහවුරු කිරීමට විකුණුම් ස්ථාන යන්ත්‍ර භාවිත කිරීම සඳහා විධිවිධාන සලස්වනු ලැබේ.

***13 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ තමා හිමිකම් නොදරන ආපසු ගෙවීමක් සඳහා හිමිකම් කියාපාන තැනැත්තන් දක්වා දණ්ඩන විධිවිධාන පුළුල් කිරීම වේ.

***14 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ බදු ආපසු ලබා ගැනීමට ව්‍යාජ හෝ නොමඟ යවනසුලු තොරතුරු හෝ ලේඛන ඉදිරිපත් කරන හෝ නියම කරන ලද තොරතුරු හෝ ලේඛන ඉදිරිපත් කිරීම පැහැර හරින තැනැත්තන් දක්වා දණ්ඩන විධිවිධාන පුළුල් කිරීම වේ.

***15 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ වන වැරදි සඳහා අපරාධ නඩු කටයුතුවලට අදාළ විධිවිධාන සැලැස්වීම වේ.

***16 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ විනිවිදභාවය තහවුරු කිරීම සහ බදුවලට අනුකූලවන අස්ථිත්ව හඳුනාගැනීම වේ.

***17 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ පැහැදිලි කිරීමේ කාර්යය සඳහා ඇතැම් පදවලට අර්ථ නිරූපණ හඳුන්වාදීම වේ.

***18 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ III වන කොටස සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ පිළිවෙළින් ක්‍රමෝපාය වටිනාකමක් සහිත ව්‍යාපාර ලෙස හඳුනාගන්නා ලද සහ අනුමත කරන ලද යම් ව්‍යාපාරයක භාණ්ඩවලට හෝ සේවාවලට අදාළව (අ) ඡේදයට අලුත් අයිතමයක් හඳුන්වා දීම සහ නිර්වාසික තැනැත්තකු විසින් ඉලෙක්ට්‍රොනික වේදිකාවක් හරහා ඇතැම් සේවා සැපයීමට අදාළව ඒ කොටසට (ඇ) අලුත් ඡේදය හඳුන්වා දීම වේ.

එල්.ඩී.-ඕ 33/2025

## 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2026 අංක    දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2002 අංක 14 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මේ පනතේ "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "2025 ඔක්තෝබර් මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි," යන වචන වෙනුවට "2026 ජූලි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි," යන වචන ආදේශ කිරීම මගින් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (8) වන උපවගන්තියේ "මුදල විය යුතු ය." යන වචන වෙනුවට "මුදල විය යුතු ය:" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (8) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අතුරු විධානය එකතු කිරීමෙන් :-

"එසේ වුව ද, ටිකට්පත් නිකුත් කිරීම මත චිත්‍රපටයක් ප්‍රදර්ශනය කිරීම සඳහා සේවාවක් සපයනු ලබන අවස්ථාවක, යම් පළාත් පාලන ආයතනයක් විසින් (267 වන අධිකාරය වූ) විනෝද බදු ආඥාපනත යටතේ අය කරනු ලබන

PL 15778 - 342 (2026/05)

"විනෝද බද්ද", මේ වගන්තිය යටතේ කරනු ලබන අඩු කිරීම්වලට අමතරව අඩු කරනු ලැබිය යුතු ය.".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (ආ) ඡේදයේ (vii) වන අනුඡේදයේ "විදේශීය ගැනුම්කරුවන් සඳහා" යන වචන වෙනුවට "2025 ඔක්තෝබර් මස 1 වන දිනට පෙරාතුව, විදේශීය ගැනුම්කරුවන් සඳහා;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (ආ) ඡේදයේ (vii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(viii) 2025 ඔක්තෝබර් මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, විදේශීය ව්‍යාවහාර මුදලින් කරනු ලබන ගෙවීම් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සිටින තැනැත්තකුට එම සේවා සපයනු ලබන තාක් දුරට, 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරන ලද ඇඟළුම් මිලදී ගැනීමේ කාර්යාලයක් විසින් විදේශීය ගැනුම්කරුවන්ට සේවා සපයනු ලැබීමට,".

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) (viii) වන ඡේදයේ "2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු එහෙත් 2026 ජුනි මස 30 වන දින හෝ එදිනට පෙර" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) (ix) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(x) 2026 ජූලි මස 1 වන දින හෝ එදිනට පසු ශ්‍රී ලංකාව තුළ යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කරන හෝ කරගෙන යනු ලබන සෑම තැනැත්තකු ම -

(අ) යම් බදු අය කළ හැකි කාලසීමාවක් අවසානයේ දී එම තැනැත්තාගේ එම බදු අය කළ හැකි කාලසීමාව තුළ දී, ශ්‍රී ලංකාව තුළ භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවාවල බදු අයකළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන නවයක් ඉක්මවා ඇත්නම්; හෝ

(ආ) එවකට අවසන් වන මාස දොළහක කාලසීමාව තුළ දී, ශ්‍රී ලංකාව තුළ එම තැනැත්තාගේ භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවාවල බදු අයකළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන තිස්හයක් ඉක්මවා ඇත්නම්; හෝ

(ඇ) ඕනෑම අවස්ථාවක දී ඉදිරියේ දී එළඹෙන බදු අය කළ හැකි කාලසීමාව තුළ දී, ශ්‍රී ලංකාව තුළ එම තැනැත්තාගේ භාණ්ඩ හෝ සේවා සහ භාණ්ඩ සහ සේවාවල බදු අයකළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම මිලියන නවයක් ඉක්මවීමට ඉඩ ඇති බවට හෝ ඉදිරියේ

දී එළඹෙන මාස දොළහක කාලසීමාව තුළ දී රුපියල් මිලියන තිස්හයක් ඉක්මවීමට ඉඩ ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්නම්,

එම තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් විය යුතු ය.”.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ අතුරු විධානයේ “කොමසාරිස්-ජනරාල්වරයා විසින් ඒ සඳහා අවසර ලබා දිය හැකි ය;” යන වචන වෙනුවට “කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ සඳහා අවසර ලබා දිය හැකි ය:” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ අතුරු විධානයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අතුරු විධානය එකතු කිරීමෙන්:-

“එසේම තවදුරටත්, යම් ලියාපදිංචි කළ තැනැත්තකු විසින්, (ආ) ඡේදයේ සඳහන් කරනු ලැබ ඇති උපලේඛන, අදාළ බදු අයකළ හැකි කාලසීමාව ආරම්භ වන දිනයේ සිට සපයනු ලැබිය හැකි ය.”.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ (vi) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(vii) මේ පනතේ විධිවිධාන යටතේ වූ ව්‍යාපෘතිවල භාවිතය සඳහා ආනයනය කර ඇති පිරියත, යන්ත්‍ර සූත්‍ර, උපකරණ හෝ වාහනවල බදු ගෙවීම විලම්බනය කරනු ලැබ ඇත්නම් සහ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් මාසයක් ඇතුළත ඒ පිරියත, යන්ත්‍ර සූත්‍ර, උපකරණ හෝ වාහන නැවත අපනයනය කරනු ලැබ නොමැති නම්."; සහ

(2) ඒ වගන්තියේ (14) වන උපවගන්තියේ අතුරු විධානයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(15) මේ වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, තොග හෝ සිල්ලර වෙළඳාම සඳහා භාණ්ඩ සපයනු ලබන යම් තැනැත්තකු 2026 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසු ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා මේ පනත යටතේ ලියාපදිංචි වී ඇති අවස්ථාවක සහ ලියාපදිංචි වන දිනය වන විට ඒ තැනැත්තා සතුව පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා නොමැති යම් භාණ්ඩ තොග නොවිකුණා ඉතිරිව ඇති අවස්ථාවක, ඒ තොග සඳහා, 2 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති සහ ඒ භාණ්ඩ ලබාගන්නා අවස්ථාවේ බලාත්මකව පවතින අනුප්‍රමාණය මත ගණනය කරනු ලැබ ඇති සලකනු ලබන යෙදවුම් බද්දක් සඳහා ලියාපදිංචිය බලාත්මක භාවයට පත් වූ බදු අය කළ හැකි කාලසීමාව සඳහා ඒ තැනැත්තාට ඉඩ දෙනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ තැනැත්තා විසින්, මේ උපවගන්තියේ සඳහන් කර ඇති නොවිකිණූ භාණ්ඩ තොගවලට අදාළ වාර්තා කොමසාරිස් ජනරාල්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ

කරන ලද නියමයක් මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ආකාරයේ ආකෘතියෙන් සියලු විස්තර ඇතුළත්ව පවත්වාගෙන යා යුතු අතර, ලියාපදිංචිය බලාත්මකව පවතින බදු අය කළ හැකි කාලසීමාව සඳහා අදාළ වාර්තා ද සමග ඒ වාර්තා සපයනු ලැබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වන වගන්තිය සංශෝධනය කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 25ඇ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "සියලුම සේවා නියුක්තයන්ට ගෙවන ලද පඩිනඩිවලට-'' යන වචනවලින් ආරම්භව "2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 119 වන වගන්තියේ (අ) ඡේදය යටතේ පවත්වාගෙන යන වැටුප් පත්‍රිකාවේ පිළිබිඹුවන්නා වූ අදාළ පඩිනඩි සහ;'' දක්වා වූ වචන සහ ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"සියලු ම සේවා නියුක්තයන්ට ගෙවිය යුතු පඩිනඩිවලට -

(අ) (i) 2018 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ XIV වන පරිච්ඡේදය යටතේ "නිශ්චිත සේවා නියුක්තයන්'' සම්බන්ධයෙන් වන විට, ඒ සේවා නියුක්තයන්ට ගෙවිය යුතු වූ ද, ඒ පනතේ 119 වන වගන්තිය යටතේ පවත්වාගෙන යන වැටුප් පත්‍රිකාවේ පිළිබිඹු වන්නා වූ ද දළ පඩිනඩි; සහ

(ii) 2018 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ඇතුළත් කිරීමට අවශ්‍ය වන්නා වූ ද එහෙත් ඒ පනතේ 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ලැබීම් සහ ලාභවලින් බැහැර වන්නා වූ ද යම් ලැබීම් සහ ලාභ,

ඇතුළත් වේ:

එසේ වුව ද, 2026 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව අවසන් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා, 25ආ වගන්තිය යටතේ ලියාපදිංචි නිශ්චිත ආයතනයක් හෝ වෙනත් තැනැත්තකු විසින් මේ උපවගන්තියේ (i) වන අයිතමයට අනුකූලව වාර්තාවක් සපයනු ලැබ ඇති අවස්ථාවක දී, එම වාර්තාව මේ උපවගන්තියට අනුකූලව සපයන ලද වාර්තාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ කාර්යය සඳහා, ලැබීම් සහ ලාභ, සාධාරණ වෙළඳපළ වටිනාකම විය යුතු ය.”.

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (උ) ඡේදයේ “2022 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු සියයට දහඅටක් විය යුතු ය.” යන වචන සහ ඉලක්කම් වෙනුවට “2022 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු, එහෙත් 2026 ජූනි

මස 30 වන දින හෝ එදිනට පෙර අවසන් වන කාලසීමාව සඳහා සියයට දහඅටක් විය යුතු ය;'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(ඌ) 2026 ජූලි මස 1 වන දින හෝ එදිනට පසු සියයට විස්සයි දශම පහක් (20.5) විය යුතු ය.";

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ -

(අ) එහි (ඉ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඉ) සේවා නියුක්ති භාර අරමුදල ඇතුළු යම් අනුමත අර්ථසාධක අරමුදලකට හෝ විශ්‍රාම අරමුදලකට හෝ යම් සකසුරුවම්, ඉතිරි කිරීමේ හෝ ගොඩනැගිලි සමිතියකට සේවා නියුක්තයන් පමණක් දායක වනු ලබන සුභසාධක අරමුදලකට හෝ යම් අනුමත විශ්‍රාම පාරිතෝෂික අරමුදලකට උපදින හෝ උපචිත වන පොලී මත ලාභ හෝ ආදායම හෝ මේ පරිච්ඡේදයේ අර්ථානුකූලව "නිශ්චිත ආයතනයක්" නොවන හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි නොවූ එහෙත් මූල්‍ය සමාගමක් විසින් සපයනු ලබන සේවාවලට සමාන සේවා සැපයීමේ යෙදී සිටින තැනැත්තකු හැර යම් තැනැත්තකුට උපදින හෝ උපචිත වන (ව්‍යාපාරයකින් ලැබෙන ලාභ නොවන) පොලී ආදායමට;"; සහ

(ආ) 5 වන උපවගන්තියේ (ඊ) ඡේදයේ "යම් තැනැත්තකුට උපදින ලාභාංශ ආදායමට;" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

"යම් තැනැත්තකුට උපදින ලාභාංශ ආදායමට.

සැකදුරු කිරීම සඳහා, නිශ්චිත ආයතනයක් නොවන සහ 25ඊ වගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ), (උ) හෝ (ඌ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති යම් සේවා සැපයීම මගින් ව්‍යාපාර ආදායම උපයනු නොලබන යම් තැනැත්තකුට ලැබෙන ලාභාංශ ආදායම ව්‍යාපාරයෙන් ලැබෙන ලාභය ලෙස සලකනු නොලැබිය යුතු ය;".

ප්‍රධාන ප්‍රඥප්තියට IIIඇ වන අලුත් පරිච්ඡේදය ඇතුළත් කිරීම

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ IIIආ වන පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ IIIඇ වන පරිච්ඡේදය ලෙස බලපැවැත්විය යුතු ය:-

**"IIIඇ වන පරිච්ඡේදය**

**ඩිජිටල් සේවා මත බද්ද ලියාපදිංචි කිරීම සහ ගෙවීම**

ඩිජිටල් සේවා සැපයුම් කරන තැනැත්තන් ලියාපදිංචි කළ යුතු බව

**25ඕ.** (1) 10 වන වගන්තියේ කුමක් සඳහන් වුව ද, ශ්‍රී ලංකාවේ තැනැත්තකුට ඉලෙක්ට්‍රොනික වේදිකාවක් මගින් (මෙහි මින් මතු "ඩිජිටල් සේවා" යනුවෙන් සඳහන් කරනු ලබන) සේවා සපයනු ලබන නිර්වාසික තැනැත්තකුගේ, -

(අ) 2026 ජූලි මස 1 වන දින හෝ එදිනට පසු එවකට අවසන් වන මාස දොළහක කාලසීමාව තුළ ඒ සේවා සැපයුම්වල සමස්ත වටිනාකම,

රුපියල් මිලියන තිස්හයක් හෝ වෙනත් යම් ව්‍යවහාර මුදලකින් ඊට සමාන මුදලක් ඉක්මවා ඇත්නම්; හෝ

(ආ) 2026 ජූලි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භවන යම් කාර්තුවක් සඳහා, ඒ සේවා සැපයුම්වල සමස්ත වටිනාකම, කාර්තුවක් සඳහා රුපියල් මිලියන නවයක මුදලක් හෝ වෙනත් යම් ව්‍යවහාර මුදලකින් ඊට සමාන මුදලක් ඉක්මවන්නේ නම් හෝ ඉක්මවීමට ඉඩ ඇත්නම්,

ඒ තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් විය යුතු සෑම තැනැත්තකු ම, ලියාපදිංචි වීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වන ලද ආකෘතියෙන් වන අයදුම්පත්‍රයක්, ඔහු එසේ ලියාපදිංචි කරනු ලැබීමට නියම කරනු ලබන දිනය හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ ආකෘතිය නිශ්චිතව දක්වනු ලැබ ඇති දිනය අතුරින් පසුව එන දිනයේ සිට මාස තුනක් ඇතුළත ඉලෙක්ට්‍රොනිකව ඉදිරිපත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ අයදුම් පත්‍රයක් ලැබීමෙන් පසු, කොමසාරිස් ජනරාල්වරයා විසින්, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති නියමයන්ට අනුකූලවන (මෙහි මින් මතු "ලියාපදිංචි නිර්වාසික ඩිජිටල් සේවා සැපයුම්කරු" යනුවෙන් සඳහන් කරනු

ලබන) නිර්වාසික තැනැත්තකු ලියාපදිංචි කර ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබා දිය යුතු ය.

(4) ලියාපදිංචි කිරීමේ සහතිකයට, -

(අ) එම තැනැත්තා සහ ඔහු සිටින ස්ථානය හඳුනා ගැනීමට අවශ්‍ය විය හැකි පරිදි, ලියාපදිංචි නිර්වාසික ඩිජිටල් සේවා සැපයුම්කරුගේ නම සහ ලිපිනය, පදිංචි රට, ලියාපදිංචිය බලාත්මක වන දිනය සහ එකතු කළ අගය මත බදු ලියාපදිංචි අංකය සහ වෙනත් අදාළ තොරතුරු ඇතුළත් විය යුතු ය; සහ

(ආ) ඉලෙක්ට්‍රොනිකව හෝ ලිඛිතව නිකුත් කරනු ලැබිය හැකි ය.

(5) නිර්වාසික ඩිජිටල් සේවා සැපයුම්කරුවකු විසින්, ස්වකීය සේවාවන් සපයනු ලබන අතරවාරයේ දී පවතින හෝ ලබාගත් තොරතුරු මත පදනම්ව, ඩිජිටල් සේවා සැපයුම්ලාභියකු පහත දැක්වෙන කොන්දේසි දෙකක් හෝ ඊට වැඩි ගණනක් සපුරාලන අවස්ථාවක දී, එකී ඩිජිටල් සේවා සැපයුම්ලාභියා ශ්‍රී ලංකාවේ තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය:-

(අ) සැපයුම්ලාභියාගේ බිල්පත් යවනු ලබන ස්ථානයේ, නේවාසික ස්ථානයේ හෝ ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය ශ්‍රී ලංකාවේ වීම;

(ආ) එම ඩිජිටල් සේවා සඳහා වන ගෙවීම ශ්‍රී ලංකාවේ බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් හරහා සිදු කරනු ලැබීම;

(ඇ) ගනුදෙනුව සඳහා භාවිත කරනු ලබන ගෙවීම් සාධනපත්‍රය ශ්‍රී ලංකාව තුළ දී නිකුත් කරනු ලැබීම; හෝ

(ඈ) සැපයුම්ලාභියා විසින් භාවිත කරනු ලබන උපාංගයේ අන්තර්ජාල ප්‍රොටකෝල ලිපිනය ශ්‍රී ලංකාවේ පිහිටා තිබීම.

ඩිජිටල් සේවා සැපයුම්කරුගේ ලියාපදිංචිය අවලංගු කිරීම

**25ක.** (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් -

(අ) ලියාපදිංචි නිර්වාසික තැනැත්තා 25ඕ වගන්තිය යටතේ ලියාපදිංචි වීමට සුදුසුකම් නොලබන බව සොයා ගන්නා ලද අවස්ථාවක දී;

(ආ) සේවා සැපයුම මාස හයකට වඩා වැඩි කාලයක් නතර වී ඇති අවස්ථාවක දී; හෝ

(ඇ) ඩිජිටල් සේවා සැපයුමේ සමස්ත වටිනාකම අනුගාමී බදු අය කළ හැකි කාලසීමා දෙකක් සඳහා 25ඕ වගන්තියේ දක්වා ඇති වටිනාකම ඉක්මවා නොයන අවස්ථාවක දී,

ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය යුතු ය.

(2) ලියාපදිංචි නිර්වාසික ඩිජිටල් සේවා සැපයුම්කරු විසින් ඩිජිටල් සේවා සැපයුම නතර කරනු ලැබ ඇති හෝ ඩිජිටල් සේවා සැපයුමේ සමස්ත වටිනාකම අනුගාමී බදු අය කළ හැකි කාලසීමා දෙකක් සඳහා 25ඕ වගන්තියේ දක්වා ඇති වටිනාකම ඉක්මවා නොයනු ලබන සහ ඒ නතර කිරීමේ දිනයේ සිට හෝ ඒ අනුගාමී බදු අය කළ හැකි කාලසීමා ඉකුත් වන දිනයේ සිට දින තිහක් ඇතුළත අවස්ථාවෝචිත පරිදි ලියාපදිංචිය අවලංගු කිරීමට ඒ සේවා සැපයුම්කරු විසින් කොමසාරිස් ජනරාල්වරයාට ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවේ දී, තත්කාර්ය සඳහා කරන ලද ඉල්ලීම පිළිබඳව කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන්නේ නම්, ඔහු විසින් ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කිරීමක් අවලංගු කරනු ලබන අවස්ථාවක දී, කොමසාරිස් ජනරාල්වරයා විසින්, ඒ අවලංගු කිරීම බලාත්මක වන දිනය සහ ඒ අවලංගු කිරීමට හේතු ඩිජිටල් සේවා සැපයුම්කරු වෙත දැනුම් දිය යුතු ය.

නිර්වාසික තැනැත්තන් විසින් ලියාපදිංචි තැනැත්තන් හට ඩිජිටල් සේවා සපයනු ලැබීම

**25ග.** (1) 2 වන වගන්තියේ සහ මේ පරිච්ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, ඒ සේවාලාභියා මේ පනත යටතේ ලියාපදිංචි වූ තැනැත්තකු වන අවස්ථාවක, නිර්වාසික තැනැත්තකු විසින් ඉලෙක්ට්‍රොනික වේදිකාවක් මගින් කරනු ලබන සේවා සැපයුම සඳහා, 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ පනවන ලද බදු අය කිරීම හෝ එකතු කිරීම, නොකළ යුතු ය:

එසේ වුව ද, නිර්වාසික ඩිජිටල් සේවා සැපයුම්කරුවකු විසින්, ඩිජිටල් සේවා සැපයුම සඳහා බදු අය කර ඇති හෝ එකතු කර ඇති අවස්ථාවක දී, ඒ සේවා සැපයුම්කරු විසින් එසේ අය කළ හෝ එකතු කරන ලද බද්ද, ඒ සේවා සැපයුම්ලාභියා වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය:

එසේම තවදුරටත්, කොමසාරිස් ජනරාල්වරයා වෙත බදු ප්‍රේෂණය කර තිබීම නිසා, එසේ අය කරන ලද හෝ එකතු කරන ලද බදු ආපසු ගෙවීමට සේවා සැපයුම්කරුට නොහැකි අවස්ථාවක දී, එසේ අය කරන ලද හෝ එකතු කරන ලද බදු සම්බන්ධයෙන් පහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතු ය:-

(අ) එම බද්ද, ඩිජිටල් සේවා සැපයුම සම්බන්ධයෙන් ලියාපදිංචි තැනැත්තකු විසින් ලියාපදිංචි නිර්වාසික ඩිජිටල් සේවා සැපයුම්කරුවකුට ගෙවන ලද්දේ නම්, ඒ බද්ද යෙදවුම් බද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම ලියාපදිංචි තැනැත්තාට මේ පනතේ 22 වන වගන්තිය යටතේ ඉඩ දෙනු ලබන තාක් දුරට නිමැවුම් බද්දෙන් ඒ යෙදවුම් බද්ද අඩු කිරීමේ හිමිකම තිබිය යුතු ය;

(ආ) යෙදවුම් බද්දට හිමිකම් පෑමේ කාර්යය සඳහා, ලියාපදිංචි නිර්වාසික ඩිජිටල් සේවා සැපයුම්කරු විසින් ඒ ලියාපදිංචි තැනැත්තා වෙත, අය කරන ලද

එකතු කළ අගය මත බද්දේ වටිනාකම වෙන වෙන ම නිශ්චිතව දක්වමින් නිකුත් කරන ලද ඉන්වොයිස් පත්‍රය, වලංගු ඉන්වොයිස් පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සේවා සැපයුම බදු අය කිරීමෙන් බැහැර කර ඇති අවස්ථාවක දී, ඒ සැපයුම කරනු ලබන නිර්වාසික තැනැත්තා විසින්, නියම කරන ලද ආකාරයට සහ නියම කරන ලද කාලසීමාව තුළ, ලියාපදිංචි වූ තැනැත්තන්ට කරන ලද සැපයුම්වල විස්තර අන්තර්ගත සරල කරන ලද ප්‍රකාශයක් කොමසාරිස් ජනරාල්වරයා වෙත සපයනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් කරන ලද ප්‍රකාශය පහත දැක්වෙන විස්තරවලට පමණක් සීමා විය යුතු ය :-

(අ) අවස්ථාවෝචිත පරිදි, ගෙවීම සිදුකළ දිනය හෝ ඉන්වොයිස් පත්‍රයේ දිනය;

(ආ) සැපයුම්ලාභියාගේ බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය;

(ඇ) සැපයුම්ලාභියාගේ නම;

(ඈ) සැපයුමේ වටිනාකම;

(ඉ) ඉන්වොයිස් පත්‍රයේ අංකය; සහ

(ඊ) සපයන ලද සේවාවේ විස්තරය.

(4) (2) වන උපවගන්තියේ විධිවිධාන වලට අනුකූල වීමට යම් තැනැත්තකු අපොහොසත් වන අවස්ථාවක දී, කොමසාරිස් ජනරාල්වරයා විසින් -

(අ) රුපියල් පනස් දහසක් නොඉක්මවන මුදලක දඩයක් ඒ තැනැත්තාට පැනවීම සහ ඒ දඩය පැනවීම පිළිබඳව ඒ තැනැත්තා හට ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින් දැනුම් දීම; හෝ

(ආ) ඒ තැනැත්තාට -

(i) ඒ දඩය ගෙවීමට; සහ

(ii) ඒ දැන්වීමෙ නිශ්චිතව දැක්විය හැකි කාලසීමාව තුළ (2) වන උපවගන්තියේ විධිවිධාන සමග අනුකූල වීමට ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින් දැනුම් දීම,

සිදු කළ හැකි ය.

(5) යම් තැනැත්තකු (2) වන උපවගන්තියේ විධිවිධාන සමග අනුකූල වීමට අපොහොසත් වූයේ ඔහුගේ පාලනයෙන් තොර වූ කරුණු හේතුවෙන් බව සහ ඔහු ඒ විධිවිධානවලට පසුව අනුකූල වී ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත්වන ලෙස ඒ

තැනැත්තා විසින් ඕප්පු කරනු ලැබුවහොත්, කොමසාරිස් ජනරාල්වරයා විසින්, (4) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඒ තැනැත්තා වෙත පනවන ලද යම් දඩයක්, අඩු කරනු හෝ අවලංගු කරනු ලැබිය හැකි ය.

ඩිජිටල් සේවා සැපයුමේ වේලාව, අගය සහ ආකාරය

**25ච.** (1) ඩිජිටල් සේවා සැපයුමේ වේලාව සහ අගය, 4 වන සහ 5 වන වගන්තිවල විධිවිධානවලට අනුකූලව නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) කොමසාරිස් ජනරාල්වරයා විසින්, මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා ලියාපදිංචි කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ ආකාරය නියම කරනු ලැබිය හැකි ය.

ඩිජිටල් සේවා සැපයුම මත බදු ගෙවීම

**25ඡ.** (1) ලියාපදිංචි නිර්වාසික ඩිජිටල් සේවා සැපයුම්කරුවකු විසින් යම් බදු අය කළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් ගෙවනු ලැබිය යුතු බද්ද-

(අ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මාර්ගගත පද්ධතිය හරහා විද්‍යුත් ප්‍රේෂණ මගින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබිය හැකි එවැනි වෙනත් ඉලෙක්ට්‍රොනික ගෙවීම් පහසුකමක් හරහා;

(ආ) තත්කාර්ය සඳහා නම් කරන ලද බැංකු ගිණුමක් වෙත ප්‍රේෂණය කරන ලද ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් අවසර ලබාදිය හැකි විදේශ ව්‍යවහාර මුදලකින්;

(ඇ) නිර්වාසික ඩිජිටල් සේවා සැපයුම්කරු මගින් සෘජුව හෝ තත්කාර්ය සඳහා පත්කරන ලද නියෝජිතයකු හරහා,

26 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

(2) කොමසාරිස් ජනරාල්වරයා විසින් එකී ගෙවීම සඳහා කාර්යපටිපාටිය සහ නියමයන් නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

බදු වාර්තා සහ සන්නිවේදනය

**25ට.** (1) සෑම ලියාපදිංචි නිර්වාසික ඩිජිටල් සේවා සැපයුම්කරුවකු විසින් ම, 21 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි බදු අය කළ හැකි එක් එක් කාලසීමාව සඳහා ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින් බදු වාර්තාවක් ගොනු කරනු ලැබිය යුතු ය.

(2) සියලු දැන්වීම්, ලේඛන හෝ වෙනත් තොරතුරු, නිර්වාසික තැනැත්තා වෙත ඉලෙක්ට්‍රොනික මාධ්‍යයකින් භාර දෙනු ලැබිය යුතු ය.

(3) සෑම ලියාපදිංචි නිර්වාසික ඩිජිටල් සේවා සැපයුම්කරුවකු විසින් ම, ඉන්වොයිස් පදනමක් මත මේ පනත යටතේ අය කරගනු ලැබූ බදු සඳහා වග කියනු ලැබිය යුතු ය.

(4) විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට හැරවීමෙන් පැන නගින යම් විචලනයක්, බදු වාර්තා ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා නොසලකා හරිනු ලැබිය යුතු අතර එකී විචලනය, මේ පනතේ කාර්යය

සඳහා පැහැර හැර ඇති බදු මුදලක් හෝ ආපසු ගෙවිය යුතු බදු මුදලක් ලෙස සලකනු නොලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 48ඇ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48ආ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 48ඇ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

“සුනාමි සහන ව්‍යාපෘති සම්බන්ධයෙන් හිඟව පවතින බදු මුදල් කපා හැරීම

**48ඇ.** සුනාමි සහන ව්‍යාපෘතිවලට අදාළව සපයන ලද බදු අය කළ හැකි සැපයුම් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයාගේ වාර්ථාවලට අනුව මේ පනත යටතේ පවතින ලියාපදිංචි තැනැත්තකුගේ හිඟ බදු, එකී සැපයුම්වලට අදාළව මේ පනත යටතේ වන බද්ද ගෙවීම ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් භාරගනු ලැබ ඇති අවස්ථාවක දී, කොමසාරිස් ජනරාල්වරයා විසින් කපා හරිනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කිරීම

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ පළමු අතුරු විධානයේ “22 වන වගන්තියේ (5) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ) හෝ (ඉ) ඡේදවල සඳහන්” යන වචන සහ ඉලක්කම් වෙනුවට “22 වන වගන්තියේ (5) වන උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ) හෝ (ඊ) ඡේදවල සඳහන්” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් -

“(5) කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය ලබා දී ඇති යම් නිලධරයකු විසින්, 22 වන වගන්තියේ (5) වන උපවගන්තිය

ප්‍රකාරව සහ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව අවදානම මත පදනම් වූ ආපසු ගෙවීමේ යෝජනා ක්‍රමය යටතේ ආපසු ගෙවීමක් සිදුකරනු ලැබ ඇති අවස්ථාවක දී, නිසි බලය ඇතිව ක්‍රියා කර ඇති බවට සහ එකී ආපසු ගෙවීම වලංගු අන්දමින් සිදු කර ඇති බවට සලකනු ලැබිය යුතු අතර එකී නිලධරයා එකී ආපසු ගෙවීම හා සම්බන්ධ සියලු සිවිල් හෝ අපරාධ නඩුවලට එරෙහිව වගකීමෙන් මුක්ත වන්නේ ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 64ආ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 64අ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 64ආ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

“ආරක්ෂිත විකුණුම් ස්ථාන යන්ත්‍ර භාවිත කිරීම

**64ආ.** (1) සෑම ලියාපදිංචි තැනැත්තකු විසින් ම, සියලු ගනුදෙනු, ඉන්වොයිස් නිකුත් කිරීම සහ ඔහු විසින් සිදු කරන ලද බදු අය කළ හැකි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්තා කළමනාකරණය කිරීම හා පවත්වාගෙන යාම සඳහා නියම කරනු ලැබිය හැකි ආකාරයෙන්, එලෙස නියම කරන ලද දින සිට මාස තුනක් ඇතුළත ආරක්ෂිත විකුණුම් ස්ථාන යන්ත්‍ර භාවිත කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා “ආරක්ෂිත විකුණුම් ස්ථාන යන්ත්‍රය” යන්නෙන්, මේ පනතේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදන ලද යම් නියෝගවලට අනුකූලව, පිරිවැටුම සහ එකතු කළ අගය මත බද්දේ එකතු කිරීම් සහ ප්‍රේෂණ පිළිබඳ නිසි ගිණුම්කරණය තහවුරු කිරීමට හැකි වන ලෙස භාණ්ඩ හා සේවා සැපයුම් වාර්තා කිරීමේ, ඉන්වොයිස් හෝ රිසිට්පත් උත්පාදනය කිරීමේ සහ ගනුදෙනුවල දත්ත තථ්‍ය කාලයකින් නිරූපණය කිරීමේ කාර්යය

සඳහා ලියාපදිංචි තැනැත්තකු විසින් භාවිත කරනු ලබන, නියම කරනු ලැබූ ආකාරයෙන් වන කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ඉලෙක්ට්‍රොනික උපාංගයක් හෝ පද්ධතියක් අදහස් වේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) ඒ වගන්තියේ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ “මඟ හැරීමට තැත් කිරීමට හෝ ආධාර කරන්නා වූ” යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා සියලු වචන වෙනුවට “මඟ හැරීමට තැත් කිරීමට හෝ ඊට ආධාර කරන්නා වූ හෝ ආපසු ගෙවීමකට හිමිකම් නොමැතිව චේතනාන්විතව සහ වංචනික ලෙස හිමිකම් කියාපාන හෝ හිමිකම් කියාපෑමට තැත් කරන හෝ වෙනත් යම් තැනැත්තකුට එකී තැනැත්තා හිමිකම් නොදරන ආපසු ගෙවීමකට චේතනාන්විතව සහ වංචනික ලෙස හිමිකම් කියා පෑමට හෝ හිමිකම් කියා පෑමට තැත් කිරීමට ආධාර කරන්නා වූ හෝ යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු අවස්ථාවෝචිත පරිදි (2) වන උපවගන්තියේ හෝ (3) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති දඩ මුදලකට හෝ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දෙකටම යටත් වනු ලැබිය යුතු ය.” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් :-

“(2) 2025 ඔක්තෝබර් මස 1 වන දිනට පෙරාතුව වන යම් කාලසීමාවක් සඳහා -

(අ) වරද කරනු ලැබුවේ යම් බදු අය කළ යුතු කාලසීමාවක් සම්බන්ධයෙන් ද ඒ බදු අය කළ යුතු කාලසීමාව සඳහා මේ පනත යටතේ යටත්ව සිටින්නා වූ ද මගහැරියා වූ හෝ මගහැරීමට තැත් කළා වූ ද බදු මුදල මෙන් දෙගුණයකට සමාන මුදලක්; සහ

(ආ) රුපියල් විසිපන්දහසක් නොඉක්මවන මුදලකින් සමන්විත දඩයක් ගෙවීමට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම.

(3) 2025 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා -

(අ) වරද කරනු ලැබුවේ යම් බදු අය කළ යුතු කාලසීමාවක් සම්බන්ධයෙන්ද ඒ බදු අය කළ යුතු කාලසීමාව සඳහා මේ පනත යටතේ යටත්ව සිටින්නා වූ ද මගහැරියා වූ හෝ මගහැරීමට තැත් කළා වූ ද බදු මුදල මෙන් හෝ වංචනිකව, තොරතුරු වරදවා දැක්වීමෙන් හෝ ව්‍යාජ හෝ නොමග යවනසුලු තොරතුරු හෝ ලේඛන සැපයීමෙන් හෝ යම් වැදගත් කරුණක් පිළිබඳ වසන් කිරීමෙන්, ආපසු ගෙවීමක් ලබා ගැනීමට හෝ ලබා ගැනීමට තැත් කළා වූ මුදල මෙන්, දෙගුණයකට සමාන මුදලක්; සහ

(ආ) රුපියල් මිලියන එක නොඉක්මවන මුදලකින් සමන්විත දඩයක් ගෙවීමට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (ග) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්-

"(ච) වංචනිකව, තොරතුරු වරදවා දැක්වීමෙන් හෝ ව්‍යාජ හෝ නොමග යවනසුලු තොරතුරු හෝ ලේඛන සැපයීමෙන් හෝ යම් වැදගත් කරුණක් පිළිබඳ වසන් කිරීමෙන් බදු මුදලේ ආපසු ගෙවීමක් ලබා ගැනීම හෝ ලබා ගැනීමට තැත් කිරීම; හෝ

(ජ) 21 වන වගන්තිය යටතේ නියම කරන ලද වලංගු බදු ඉන්වොයිස් හෝ රේගු භාණ්ඩ ප්‍රකාශන හෝ වෙනත් සහතික කළ ලේඛන සැපයීමට අපොහොසත් වීම.";

(2) ඒ වගන්තියේ "යම් තැනැත්තකු මෙම පනත යටතේ" යන වචනවල සිට ඒ වගන්තිය අවසානය දක්වා වන වචන හා ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් -

"යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර-

(i) 2025 ඔක්තෝබර් මස 1 වන දිනට පෙරාතුව වන යම් කාලසීමාවක්

සඳහා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් විසිපන්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය; සහ

(ii) 2025 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසු යම් කාලසීමාවක් සඳහා මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියන එක නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

"අපරාධ නඩු කටයුතු

**68.** (1) මේ පනත යටතේ වන යම් වරදක් කොමසාරිස් ජනරාල්වරයා විසින් විමර්ශනය කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන යම් තැනැත්තකුට විරුද්ධව අපරාධ

නඩු පැවරීම නීතිපතිවරයා හෝ නීතිපතිවරයා විසින් බලය පවරන ලද අභිනියෝජිතයකු විසින් කරනු ලැබිය යුතු ය. එකී අපරාධ නඩු කටයුතු කොමසාරිස් ජනරාල්වරයා නමින් ආරම්භ කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ වන නඩු කටයුතු, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පවරනු ලැබිය හැකි අපරාධ නඩු කටයුතුවලට බලපෑමක් ඇති නොකළ යුතු ය.

(4) යම් තනි ක්‍රියාවක්, නොකර හැරීමක් හෝ හැසිරීම් චර්යාවක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු මේ පරිච්ඡේදය යටතේ එක් වරදකට වඩා වැඩි සංඛ්‍යාවකට වරදකරු කරනු ලබන අවස්ථාවක දී -

(අ) වැරදි සඳහා පනවනු ලබන බන්ධනාගාරගත කිරීමේ උපරිම කාලසීමාව අවුරුදු පහ නොඉක්මවිය යුතු ය; සහ

(ආ) එකම ක්‍රියාවක්, නොකර හැරීමක් හෝ හැසිරීම් චර්යාවක් සම්බන්ධයෙන් අතිරේක වැරදි සඳහා පසුව එම තැනැත්තාට එරෙහිව නඩු පැවරීම නොකළ යුතු ය.

(5) යම් තැනැත්තකු විසින් කරන ලද යම් ක්‍රියාවක්, නොකර හැරීමක් හෝ හැසිරීම් චර්යාවක් සම්බන්ධයෙන් -

(අ) එම ක්‍රියාව, නොකර හැරීම හෝ හැසිරීම් චර්යාව සම්බන්ධයෙන් එම තැනැත්තා මේ පනත යටතේ

වරදකට වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක; හෝ

(ආ) කොමසාරිස් ජනරාල්වරයාගේ එකඟතාවය ඇතිව අධිකරණය විසින් වරද සමථයකට පත්කරනු ලැබ ඇති අවස්ථාවක දී,

එම තැනැත්තා XII වන පරිච්ඡේදය යටතේ කිසිදු දඩයක් නොගෙවිය යුතු ය.

(6) චෝදනා කරනු ලබන වරද -

(අ) ක්‍රියාව සිදු කිරීමෙන් පසු වසර දොළහක් ඇතුළත යම් ක්‍රියාවක් සිදු කිරීම;

(ආ) ක්‍රියාව සිදු කිරීමට නියමිත දින සිට වසර දොළහක් ඇතුළත යම් ක්‍රියාවක් සිදු කිරීමට අපොහොසත් වීම හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් එකී අපොහොසත් වීම පිළිබඳ දැනගැනීමෙන් පසු අවුරුදු තුනක් ඇතුළත යම් ක්‍රියාවක් සිදු කිරීමට අපොහොසත් වීම යන්නෙන් පළමුව සිදුවන; හෝ

(ඇ) අදාළ බදු අය කළ හැකි කාලසීමාව සඳහා වන යම් තැනැත්තකුගේ නිවැරදි බදු වගකීම මේ පනත යටතේ අවසාන වශයෙන් නිශ්චය කිරීමෙන් පසු අවුරුදු තුනක කාලසීමාවක් ඇතුළත බදු ගෙවීම සඳහා වන එම තැනැත්තාට ඇති බැඳීම සම්බන්ධයෙන් වන

තොරතුරු එම තැනැත්තා විසින් හෙළිදරව් කරනු නොලැබීම හෝ නොමඟ යවනසුලු තොරතුරු ලබා දීම,

යන වරදවල් හා සම්බන්ධව ඇති විට දී, මේ පනත යටතේ වන නඩු කටයුතු ආරම්භ කරනු ලැබිය හැකි ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

“(1අ) (1) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මහජන විනිවිදභාවය තහවුරු කිරීම, බදු අනුකූල ආස්ථිත්‍ය හඳුනාගැනීම සහ මේ පනතේ 25ග වගන්තියේ කාර්යය සඳහා මේ පනතේ සහ වෙනත් යම් අදාළ ලිඛිත නීතියක විධිවිධාන පරිපාලනය කිරීමට සහ බලාත්මක කිරීමට පහසුකම් සැලසීමේ කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියාපදිංචි තැනැත්තාගේ නම, ලිපිනය සහ ලියාපදිංචි තැනැත්තකු හට ලබා දී ඇති බදු ලියාපදිංචි අංකය සහ එකී බදු ලියාපදිංචියේ ස්වභාවය ප්‍රකාශයට පත්කරනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) “අධ්‍යාපන සේවා” යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

““‘ඉලෙක්ට්‍රොනික වේදිකාවක්” යන්නෙන්, සේවා සපයන්නන් එක් අයකුට හෝ වැඩි ගණනකට

සේවාලාභීන් වෙත සේවා සැපයීමේ හැකියාව ලබා දෙන්නා වූ අන්තර්ජාලය හරහා ක්‍රියාත්මක වන යම් මාර්ගගත පද්ධතියක්, වෙබ් අඩවියක්, ජංගම යෙදවුමක් හෝ වෙනත් ඩිජිටල් අතුරු මුහුණතක් අදහස් වේ;";

(2) "සුදුසුකම් ලබන ආනයනකරු" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් :-

""“සුදුසුකම් ලබන ආනයනකරු" යන්නෙන්, කලින් ලිත් වර්ෂය තුළ දී, 7 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති ශුන්‍ය අනු ප්‍රමාණගත සැපයුම් වටිනාකම, එම කාලසීමාව තුළදී ම එම තැනැත්තා විසින් කරන ලද සැපයුම්වල මුළු වටිනාකමෙන් සියයට පනහකට වඩා වැඩි ලියාපදිංචි තැනැත්තකු අදහස් වේ;";

(3) "පොල්මඃකරු" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

""“ස්ථිර ස්ථානය" යන්නෙන්, යම් තැනැත්තකුගේ පාලනයට යටත් වනු ලබන සහ එහි පිහිටා ඇති මානව හා තාක්ෂණික සම්පත් භාවිත කරමින් ඒ තැනැත්තාගේ ව්‍යාපාර කටයුතු පිළිබඳ කාර්ය සඳහා නිරන්තර සේවා ලබාදෙන හෝ සේවා ලබාගන්නා සහ සේවා භාවිත කරන ස්ථානයක් අදහස් වේ;";

(4) "අමාත්‍යවරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන් :-

"""අධ්‍යාපනික පාඨමාලා සම්බන්ධයෙන් වෙළඳපොළ" යන්නෙන්, බහුවිධ ස්වාධීන උපදේශකයින් හෝ ශිෂ්‍යයන් සහිත අධ්‍යාපනික ආයතන සම්බන්ධ කරමින් විමධ්‍යගත කේන්ද්‍රය ලෙස සේවය කරන ඩිජිටල් වේදිකාවක් මත පිරිනමනු ලබන අධ්‍යාපනික හෝ පුහුණු වැඩසටහන් අදහස් වේ;

"නිර්වාසික තැනැත්තා" යන්නෙන්, ඇතැම් විට නැතහොත් අන්‍යාකාරයකින් ප්‍රධානියා හෝ අනුයෝජිතයා ලෙස සේවා සැපයීම සම්බන්ධ වන ගනුදෙනු සිදු කරන, නමුත් ශ්‍රී ලංකාව තුළ ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් නොමැති යම් තැනැත්තකු අදහස් වන අතර, ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් නොමැතිව නමුත් 55 වන වගන්තියේ සඳහන් කර ඇති පරිදි එම තැනැත්තා වෙනුවෙන් කටයුතු කිරීමට අනුයෝජිතයකු සිටින ශ්‍රී ලංකාව තුළ බදු අය කළ හැකි කටයුතු සිදුකරන හෝ පවත්වාගෙන යන 10 වන වගන්තිය යටතේ ලියාපදිංචි තැනැත්තකු ඊට ඇතුළත් නොවේ;"; සහ

(5) "බදු අය කළ හැකි කාලසීමාව" යන යෙදුමේ අර්ථ නිරූපණයේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ -

(අ) (ii) වන අනුඡේදයේ, "22 වන වගන්තියේ (7) වන උපවගන්තියේ;" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව අතරතුර 22 වන වගන්තියේ (7)

වන උපවගන්තියේ;'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ආ) (iii) වන අනුඡේදයේ, ''එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන කාලසීමාව තුළ දී හෝ මේ පනතේ පළමුවන උපලේඛනයේ'' යන වචන වෙනුවට ''මේ පනතේ පළමුවන උපලේඛනයේ'' යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ III වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ කොටසේ (අ) ඡේදයේ (xi) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන නව අයිතමය එකතු කිරීමෙන් :-

''(xii) ජාතික යහපත හෝ ජාතික ආර්ථිකයේ දියුණුව සැලකිල්ලට ගෙන, 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 52 වන වගන්තියේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව ක්‍රමෝපාය වටිනාකමක් සහිත ව්‍යාපාරයක් වශයෙන් හඳුනාගෙන ඇති සහ අනුමත කළ යම් ව්‍යාපාරයක භාණ්ඩ නැතහොත් සේවා.'';

(2) ඒ කොටසේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :-

''(ඉ) නිර්වාසික තැනැත්තකු විසින් ඉලෙක්ට්‍රොනික වේදිකාවක් හරහා පහත දැක්වෙන සේවාවන් සැපයීම :-

(i) මාර්ගගත පාඨමාලා, සම්මන්ත්‍රණ, පුහුණු, ඩිජිටල් අධ්‍යාපන වේදිකා, අතථ්‍ය පන්ති කාමර, වෙළඳපොළවල්හි ඇති ඉගෙනුම් කළමනාකරණ පද්ධති සහ පාඨමාලා ඇතුළු අධ්‍යාපන සේවා;

(ii) මාර්ගගත උපදේශනය, ඩිජිටල් බෙහෙත් වට්ටෝරු, කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිත රෝග විනිශ්චයන්, ඩිජිටල් සෞඛ්‍ය නිරීක්ෂන සහ දුරස්ථ වෛද්‍ය සේවා ඇතුළු සෞඛ්‍ය ආරක්ෂණ සේවා;

(iii) යම් අදාළ ලිඛිත නීති යටතේ නිශ්චිතව දක්වා ඇති තාක් දුරට හෝ ශ්‍රී ලංකා ආණ්ඩුව හෝ ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනුවෙන් ඇතුළත් වී ඇති යම් ලිඛිත ගිවිසුමකට අනුකූලව, යම් සංවිධානයකට හෝ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලයකට සපයනු ලබන සේවා.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**19.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.